**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ("මණ්ඩලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ආයතන වලින් ලැබිය යුතු මුදල රු.873,876,132 ක් වූ අතර ඉන් රු.143,523,834 ක අගයක් හෝ සියයට 16ක් වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි. හානිකරණය සඳහා වූ ප්‍රතිපාදනය රු. 359,321,925 ක් වන අතර එය 2022 දෙසැම්බර් 31 වන දිනට පැවති ලැබිය යුතු මුළු අගයෙන් සියයට 41ක් නියෝජනය කරයි. | වසර පහකට වඩා වැඩි හිඟ මුදල් වලින් වැඩි ප්‍රමාණයක් අවලංගු කරන ලද හෝ නවතා දැමූ ව්‍යාපෘති වලින් ලැබිය යුතු හිඟ මුදල් බව. | හිඟ මුදල් අය කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | රු.169,242,658 ක් වූ වෙනත් ලැබිය යුතු මුදල් වලින් රු.164,144,352 ක් හෝ සියයට 97 ක් වසර පහකට වඩා වැඩි කාලයක් හිඟ හිටව පැවතුණි. | හිඟ මුදල් අය කරගැනීමට හෝ නිසි අනුමැතියකින් හිඟ මුදල් කපා හැරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | - එම - |
| (ඇ) | සීමාසහිත ලංවා සංස්ථා සිමෙන්ට් කෝපරේෂන් පෞද්ගලික සමාගමෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ මුදල රු.152,842,821 ක් වන අතර මෙම අගය 2019 වසරේ සිට පසුගිය වර්ෂ සඳහා ගෙවීම් පැහැර හැරීම නිසා එකතු වී තිබුණි. | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නීති උපදෙස් ලබාගත් අතර ගැටළුව නිරාකරණය කිරීම සඳහා ආයතනය සමඟ රැස්වීම් කිහිපයක්ද පැවැත් වූ බව සහ මේ වන විට ආයතනයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරීත්වය සළකා බලමින් සිටින බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුළු හිඟ මුදලින් සියයට 90 ක් වූ වාර්ෂික ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී 2022 දෙසැම්බර් 31 දිනට රු.227,360,269 ක් හානිකරණය සඳහා වෙන් කිරීමක් සිදු කර තිබුණි. තවද, සියයට 92 ක් වූ එම වෙන්කිරීමෙන් සියයට 90 ක වෙන්කිරීමක්, රු. 24,706,100 ක් වූ ප්‍රාග්ධන අලාභය සඳහා සිදු කර තිබුණි. | සළකා බලන ලද බව. | - | එම - |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මූල්‍ය රෙගුලාසි අංක 371 උපවගන්තිය 05 සහ උපවගන්තිය 02 (ආ) | කටුනායක අපනයන සැකසුම් කලාපයේ සහ සීතාවක අපනයන සැකසුම් කලාපයේ වියදම් නොකළ අත්තිකාරම් මුදල් පියවීම, ගෙවීම සිදු කළ වහාම සිදු කර නොතිබුණි. තවද, සීමාව ඉක්මවා තාවකාලික උප අග්‍රිම එකක් නිකුත් කර ඇත. | මෙම අංශයේ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැනටමත් උපදෙස් නිකුත් කර ඇති බව, අත්තිකාරම් පියවීම් ප්‍රමාද වීම් වැළැක්වීම සඳහා අපි ඉදිරියේදී තවදුරටත් ක්‍රියාමාර්ග ගන්නා බව. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුයි. |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.2.1, 8.9.1(අ), 8.9.3, 4,3,1 සහ 5.1.1 (අ) මාර්ගෝපදේශයන්ට පටහැනිව සීතාවක අපනයන සැකසුම් කලාපයේ අධ්‍යක්ෂ බංගලාව දක්වා දිවෙන මාර්ගය ඉදිකිරීම සිදු කර ඇත. | මෙම අරමුණ සඳහා පත් කළ ත්‍රිපුද්ගල කමිටුව (ආයතනයේ ඉංජිනේරුවන් 02 සහ අධ්‍යක්ෂ - අපනයන සැකසුම් කලාපය) මගින් කාර්යය ප්‍රදානය කර අධීක්ෂණය කර ඇති බව, මෙම ව්‍යාපෘතිය සඳහා රජයේ මුදල් යොදවා නොමැති බැවින් කමිටුව ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කර නොමැති බව. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) | 2016 අප්‍රේල් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 සහ 2016 ඔක්තෝබර් 22 දිනැති අංක 02/2016 (01) දරන චක්‍රලේඛය | විධායක අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ විධායක අධ්‍යක්ෂවරයකු සඳහා වූ අනුමත වැටුප් කේතය HM 2-1 සහ HM 1-1 වුවද, මණ්ඩලය විසින් අදාළ නිලධාරීන් HM 2-2 සහ HM 1-2 වැටුප් කේතයන් යටතේ පිහිටුවා ගෙන තිබුණි. | චක්‍රලේඛයට අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ විධායක අධ්‍යක්ෂවරුන් නිවැරදි වැටුප් කේතය මත පිහිටුවීම සඳහා කටයුතු යොදා ඇති බව. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 පොදු ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| I. | රජය සතු ව්‍යාපාර (SOEs) සඳහා වූ සංයුක්ත මනා පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ | | | |
| i. | 2.6 වගන්තිය | විධායක අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පත් කර තිබුණි. | භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 පාදක කර ගනිමින් 2022.05.04 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක අධ්‍යක්ෂ (මානව සම්පත් සහ පරිපාලන) හට අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ධූරයේ තවදුරටත් කටයුතු කිරීමට අනුමැතිය ලබා දී ඇති බව. | පොදු ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුයි. |
| ii. | 3.1 වගන්තිය | වෙබ් අඩවිය තුළ අවම වශයෙන් පසුගිය වසර 05 ක වාර්ෂික වාර්තා ඇතුළත් කළ යුතු වුවද, 2023 ජුලි 31 දින වන විට 2019 සහ 2020 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පමණක් වෙබ් අඩවියට උඩුගත කර තිබුණි. | වසර 2021 වාර්තාව ඉක්මනින් උඩුගත කෙරෙනු ඇත. | - එම - |
| II. | රාජ්‍ය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත | | | |
| | වගන්තිය 3.1 සහ 3.2 | මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා දීමනා ලෙස රු. 544,263,823 ක් සහ ප්‍රසාද දීමනා ලෙස රු. 68,039,960 ක් ගෙවා තිබුණි. | 2021.12.02 දිනැති ලිපියක් මගින් භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා තිබුණි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. රු. 2,921,657,387 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,363,405,054 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,558,252,333 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම් සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.1,062,045,353 කින් සහ රු. 1,075,572,421 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනතේ රෙගුලාසිවලට අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කිරීම සහ පරිසර ආරක්ෂණ බලපත්‍රය කල් ඉකුත් වන දිනට මාස 03කට පෙර අලුත් කිරීමේ අයදුම්පත ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වුවත්, කෙසේ වෙතත්, එම ක්‍රියාමාර්ගය පසු විපරම් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපොහොසත් වී තිබුණි. එබැවින් සීතාවක අපනයන සැකසුම් කලාපයේ ආයතන 6ක් ඉහත අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි. | සටහන් කර ගන්නා ලද අතර පසු විපරම් කරනු ඇති බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය පසු විපරම් කළ යුතුය. |
| (ආ) | සීතාවක අපනයන සැකසුම් කලාපයේ ආරක්ෂක නිලධාරීන් සඳහා වූ අදාළ වැටුප් අනුපාතය ඉහළ දමා තිබුණද එහි සැබෑ ප්‍රතිලාභය සේවකයාට ලැබී තිබේද යන්න අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපොහොසත් වී තිබුණි. එබැවින්, සීතාවක අපනයන සැකසුම් කලාපයේ නිලධාරීන් 6 දෙනෙකු 2022 මාර්තු සහ නොවැම්බර් මාස සඳහා අවම වැටුප් අවශ්‍යතාවයට වඩා අඩු වැටුප් ලබා ගෙන තිබුණි. තවද, පෞද්ගලික ආරක්ෂක ආයතනය විසින් සේ.හා.අ (ETF) සහ සේ.අ.අ. (EPF) වෙත ඉදිරිපත් කිරීමට සකස් කරන ලද ප්‍රකාශය අනුව, ආරක්ෂක නිලධාරීන් පස් දෙනෙකුගේ නම් 2022 දෙසැම්බර් මාසය සඳහා ඇතුළත් කර නොතිබුණි. | අවම වැටුප් අනුපාතය පවත්වා ගැනීමට පුද්ගලික ආරක්ෂක සමාගම වෙත උපදෙස් දෙනු ලබන අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එය අධීක්ෂණය කරනු ලබන බව, තවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ඉන්වොයිසි පත්‍ර ඉදිරිපත් කිරීමට පෙර සේ.හා.අ (ETF) සහ සේ.අ.අ. (EPF) ප්‍රේෂණය කරන ලෙස ආරක්ෂක සමාගමට උපදෙස් ලබා දී තිබෙන බව. | ආරක්ෂක නිලධාරීන් සම්බන්ධයෙන් වැටුප් ගෙවීම සහ සේ.හා.අ (ETF) සහ සේ.අ.අ. (EPF) වෙත ප්‍රේෂණය කිරීම ආයෝජන මණ්ඩලය විසින් අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 ජූලි, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල තෝරාගත් නියැදිය තුළ ආරක්ෂක ගිවිසුමේ අංක 03 වගන්තියට අනුව අවශ්‍ය ආරක්ෂක නිලධාරීන් යෙදවීමට සීතාවක අපනයන සැකසුම් කලාපයෙහි ආරක්ෂක ආයතනය අපොහොසත් වී තිබුණි. තවද, පැය 12 ක සේවා මුර සැපයිය යුතු වුවත්, ඉන්වොයිසිවලට අනුව පැය 24 කට වඩා වැඩි සේවා මුර ද ඇතුළත් ව තිබුණි. මෙය කලාපයේ ආරක්ෂාවට අහිතකර අයුරින් බලපානු ඇත. | පැය 24 පුරාවට ආරක්ෂක නිලධාරී කාර්ය මණ්ඩලය යෙදවීමෙන් වළකින ලෙස ආරක්ෂක සමාගමට කිහිප වතාවක්ම දැනුම් දී තිබුණු බව හා එවැනි අවස්ථා අධෛර්යමත් කිරීම සඳහා දඩ මුදලක් අය කරන බව. | කලාපයේ ආරක්ෂාව තර කළ යුතුයි. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී, රුපියල් මිලියන 2,460 ක ඇස්තමේන්තුගත ආයෝජනයකින් අක්කර 400 ක් පුරා පැතිර යන ලෙස ඖෂධ නිෂ්පාදන කලාපයක් ආරබොක්ක ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ විය. | | |
| i. | මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම ප්‍රදානයක් ලෙස ලැබීම හේතුවෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර උපාය මාර්ගික පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පමණක් පවත්වා ගනිමින් මෙම ඉඩම ව්‍යාපෘතිය සඳහා යොදා ගෙන තිබුණි. | නව ඖෂධ කලාපයක් පිහිටුවීම සඳහා පිහිටුවා ඇති කමිටුවේ උපදෙස් මත මෙම විශේෂ ඖෂධ සැකසුම් කලාපය හම්බන්තොට ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණි. | ආයෝජන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනය පැවැත්විය යුතුය. |
| ii. | 2021 වර්ෂය අවසන් වන විට, යටිතල පහසුකම් සැපයීම අවසන් කළ යුතු නමුත් 2022 ඔක්තෝබර් වන විට විදුලිය පහසුකම් සැපයීම සියයට 70 ක්, ජල පහසුකම් සැපයීම සියයට 0 ක්, අධිවේගී මාර්ග පහසුකම් සැපයීම ඉතා මන්දගාමී වේ. | 2021/2022 වර්ෂ තුළ කොවිඩ් – 19 වසංගතය සහ ආර්ථික පසුබෑම සහ රාජ්‍ය වියදම් පාලනය සඳහා වූ රජයේ ප්‍රතිපත්ති හේතුවෙන් සංවර්ධන කටයුතු අත්හිටුවා තිබුණු බව. | ව්‍යාපෘති යෝජනාවට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුය. |
| iii. | 2022 අවසන් වන විට සමස්ත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල වූ රු. මිලියන 2,460න් මිලියන 1,680 ක්, එනම් අදාළ වැඩවලින් සියයට 68 ක් අවසන් කර තිබිය යුතු නමුත් මේ රටේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් 2022 ඔක්තෝබර් වන විට රු. මිලියන 275.15ක මුදලක් එනම් සියයට 10.16ක් සත්‍ය වශයෙන් මේ සඳහා වැය කර තිබුණි. | 2020-2021-2022 සහ 2023 මුල් කාලය තුළ රට, කොවිඩ් සහ දැඩි ආර්ථික පසුබෑම්වලට ගොදුරු වූ අතර ආයෝජකයින්ට හිතකර පරිසරයක් රට තුළ වර්ධනය නොවූ අතර යටිතල පහසුකම් සඳහා අවශ්‍ය මුදල් රජය විසින් දැඩි ලෙස සීමා කරන ලද බව. | ව්‍යාපෘති යෝජනාවට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| iv. | ආයෝජන මණ්ඩලය විසින් කලාපයට ආයෝජකයින් ගෙන්වා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කර තිබුණද, මූලික සාකච්ඡා සඳහා ආයෝජකයින් කිහිප දෙනෙකු සහභාගී වී ඇතත්, තවමත් කිසිදු ආයෝජකයෙකු කලාපයේ ආයෝජනය කිරීමට ඉදිරිපත් වී නොතිබුණි. | වත්මන් ගෝලීය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම පසුගාමී මට්ටමක පවතින නමුත් ඉදිරියේදී කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය සමඟ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ වඩාත් ඵලදායී ප්‍රගතියක් අපි අපේක්ෂා කරන බව. | ආයෝජකයින් ගෙන්වා ගැනීමට පියවර ගත යුතුයි. |
| (ආ) | රුපියල් මිලියන 4,770 ක ඇස්තමේන්තුවක් යටතේ එරාවූර් ප්‍රදේශයේ අක්කර 400 ක භූමි ප්‍රමාණයක රෙදිපිළි සඳහා විශේෂ කර්මාන්ත කලාපයක් පිහිටුවීමට සැලසුම් කර ඇති කර්මාන්ත කලාපය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරිණ. | | |
| i. | ඉඩම අත්පත් කර ගැනීම සඳහා තීරණ ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම කලාපය ඉදිකිරීම සඳහා අත්පත් කර ගනු ලැබූ ඉඩම වෙනුවෙන් රු.107,890,674 ක අමතර මුදලක් වැය කිරීමට ආයෝජන මණ්ඩලයට සිදු වී තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අත්හැර දැමීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන් අත්පත් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වූ බව. | ව්‍යාපෘති යෝජනාවට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| ii. | මුහුදට බැහැර කරන පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇතත් අක්කර 100කට ආසන්න භූමි ප්‍රමාණයක අයිතිය 2022 නොවැම්බර් 30 වන විටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා දී නොතිබුණි. එම ඉඩම ශ්‍රී ලංකා රජය සතු වන අතර ඊට අදාළව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2022 ඔක්තෝබර් මාසය වන විට මැනුම් කටයුතු සඳහා රු. 927,738 ක මුදලක් වැය කර තිබුණි. | මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය ඇතිව මෙම ඉඩම පැවරීමේ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතින බව. | ඉඩම පවරා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය. |
| iii. | ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සුදුසු මට්ටමකින් 2023 ජනවාරි වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු නමුත් 2022 නොවැම්බර් වන විට එය එවැනි සුදුසු මට්ටමකටවත් ළඟා වී නොතිබුණි. | 2020 මාර්තු සහ 2021 කාලයන්හිදී කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සහ 2022 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කල 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුව රාජ්‍ය වියදම් පාලනයට අදාළ දේශීය අරමුදල් යොදා ගනිමින් සිදුකරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් සංවර්ධන කටයුතු සිදුකිරීම ප්‍රමාද වූ බව. | ව්‍යාපෘති යෝජනාවට අනුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| iv. | කලාපයට ආයෝජන ආකර්ශණය කර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කර තිබුණු නමුත් මේ වන විට කලාපයේ ආයෝජනය කිරීමට එක් ආයෝජකයෙකු පමණක් ඉදිරිපත් වී තිබුණි. | වත්මන් ගෝලීය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම පසුගාමී මට්ටමක පවතින නමුත් ඉදිරියේදී කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය සමග ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ වඩාත් ඵලදායී ප්‍රගතියක් අපි අපේක්ෂා කරන බව. | ආයෝජකයින් ආකර්ශණය කර ගැනීමට පියවර ගත යුතුය. |
| v. | මූලික අභ්‍යන්තර ජල පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කිසිදු එකඟතාවකින් හෝ අවබෝධතා ගිවිසුමකින් තොරව රු. මිලියන 24.019ක් ගෙවා තිබුණි. | යටිතල පහසුකම් සඳහා උපදේශන සේවා, සැලසුම් කටයුතු සහ රාජ්‍ය ආයතනවලට සිදු කරන මුදල් ගෙවීම සඳහා වූ ඇතැම් සේවාවන් වෙනුවෙන් පසුගිය කාලයේ ආයෝජන මණ්ඩලය සමඟ වූ ගිවිසුම් සම්බන්ධයෙන් මේ දක්වා බැහැර වීමක් සිදුවී නොමැති අතර ගැටලුවක් ද පැන නැගී නොමැති බවද සඳහන් කළ යුතු බව. | ගිවිසුම් ගත විය යුතුය. |
| vi. | මූලික ජල පහසුකම් සැපයීමේ කටයුතු වෙනුවෙන් 2020, 2021 සහ 2022 වසර සඳහා රුපියල් මිලියන 16.1 ක් ඇස්තමේන්තු කර ඇති අතර, 2022 නොවැම්බර් 30 වන විට ඒ සඳහා රු. මිලියන 24ක් වැය කර තිබුණි. ඒ අනුව 2022 වසර වන විට රු. මිලියන 7.9ක් ඇස්තමේන්තුගත මුදලට ඉක්මවා වියදම් කර තිබුණි. | සටහන් කර ගන්නා ලද බව සහ එකඟ වූ බව. | ලබා දී ඇති ඇස්තමේන්තුව තුළ පිරිවැය දැරිය යුතුය. |

(ඇ) නව ආයෝජන කලාප දියත් කිරීමේ මෑතකාලීන ව්‍යාපෘති කිසිවක් අපේක්ෂිත ඉලක්ක කරා යාමට මෙතෙක් සමත් වී නොමැත. විස්තර පහත පරිදි වේ.

| ආයෝජන කලාපය | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | දරන ලද සැබෑ වියදම රු. මිලියන | මුළු ඉඩම් අක්කර | භාවිතා කරන ඉඩම් අක්කර | ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මිල්ලෑනිය | 13,474 | 2,300.5 | යෝජිත ඉඩම මෙතෙක් පවරාගෙන නැත. | | |
| බිංගිරිය | 2,266 | 1,052.3 | 440.58 | 30.72 | 3 |
| එරාවූර් | 1,750 | 361.8 | 262 | 50 | 1 |
| ආරබොක්ක | 2,460 | 275.15 | 400 | කිසිවක් නැත | |

මෑතකදී ආරම්භ කරන ලද බිංගිරිය, එරාවූර්, ආරබොක්ක වැනි කලාප 2020-2021-2022 සහ 2023 මුල් කාලය තුළ රට තුළ වූ කොවිඩ් සහ දරුණු ආර්ථික පසුබෑම්වලට ගොදුරු වූ අතර ආයෝජකයින්ට හිතකර පරිසරයක් රට තුළ වර්ධනය නොවුණු බව, යටිතල පහසුකම් සඳහා මුදල් රජය විසින් දැඩි ලෙස සීමා කරන ලද බව, . මෙම දුෂ්කර කාලසීමාව තුළ බිංගිරිය කලාපයේ ආයෝජන 04ක්, එරාවූර් කලාපයේ අක්කර 50ක් සහ ආරබොක්ක කලාපයේ අක්කර 30ක් ස්ථාපිත කිරීමට හැකිවීම සැළකිය යුතු බව.

ආයෝජකයින් වැඩි වශයෙන් ආකර්ශණය කර ගැනීමට සහ නව ආයෝජන කලාප ශක්‍ය ව්‍යාපෘති බවට හැරවීමට පියවර ගත යුතුයි.

(ඈ) කටුනායක ලක්ෂ්මි විද්‍යාලයට නුදුරින් පිහිටි අක්කර 2ක ඉඩම ලක්ෂ්මි විද්‍යාලය විසින් පරිහරණය කර ඇත. කෙසේ වෙතත්, ඉහත බාහිර පාර්ශ්වයන්ට අයිතිය පැවරීමකින් හෝ ඉඩම බදු දීමට විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව මෙම ඉඩම කටුනායක ආයෝජන සැකසුම් කලාපයේ කාර්මික නොවන ප්‍රදේශය යටතේ පෙන්වා තිබුණි.

මෙම ඉඩමේ අයිතිය තවමත් ආයෝජන මණ්ඩලය සතු වන අතර වර්තමානයේදී, මෙම පාසල සහ සාමාන්‍ය ජනතාව මෙය ක්‍රීඩා පිටියක් ලෙස භාවිතා කරන බව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව 1995 වර්ෂයේදී ලබාදුන් කැපවීම පාදක කරගනිමින් මෙම ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා ලක්ෂ්මි විද්‍යාලය වෙත අයිතිය පැවරීමට කටයුතු කරනු ඇති බව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැබිනට් තීරණයක් යටතේ ස්ථාපිත විශේෂ ඒකකයට ගෙවිය යුතු වැටුප් සහ දීමනා ලෙස රු.51,492,525ක් ක මුදලක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ඒකාබද්ධ අරමුදලට දායකත්ව මුදල වූ රු. 500,000,000 කින් අඩුකරගෙන තිබුණි. කෙසේ වෙතත්, 2022 මැයි මස අවසානයේදී බඳවාගත් නිලධාරීන් 09 දෙනාගෙන් 08 දෙනෙකු සිය තනතුරුවලින් ඉල්ලා අස්වී තිබුණු අතර 2022 වසරේ එම නිලධාරීන් 09 දෙනා සඳහා වූ මුළු ගෙවීම රු. 18,793,706 කි. එබැවින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ඉතිරි මුදල වූ රු.32,698,819 ක් ඒකාබද්ධ අරමුදලට දායකත්වය ලෙස භාණ්ඩාගාරයට ආපසු ගෙවීමට අපොහොසත් වී තිබුණු බව නිරීක්ෂණය වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට කලින් ලැබීම් ගිණුම යටතේ පෙන්වා තිබුණි. | අතිරික්ත මුදල ආපසු ගෙවීමට 2023 වර්ෂයේදී කටයුතු කරනු ඇති බව. | ඒකාබද්ධ අරමුදලේ දායකත්වයෙන් අඩු කළ මුදල් වහාම ආපසු ගෙවිය යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට ආයෝජන කලාප 13 ක අක්කර 773.09 ක භූමි ප්‍රමාණයක් හිස්ව පැවති අතර එය ආයෝජකයින් සඳහා පැවති කාර්මික ප්‍රදේශයෙන් සියයට 30 ක් නියෝජනය වේ. තවද, ආරබොක්ක (ඖෂධ) කලාපයේ සහ බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ දෙවන අදියරයෙහි පිළිවෙළින් අක්කර 751.7 ක් සහ අක්කර 282.9 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම් 2022 දෙසැම්බර් 31 දිනට ආරම්භයේ සිටම ප්‍රයෝජනයට ගෙන නිශ්කාර්යව පැවතුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට ආර්ථික කලාපවලින් පිටත අක්කර 777.11ක ඉඩම් ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුණි. | ආයෝජන මණ්ඩලය විසින් හිස් ඉඩම්, ආයෝජකයින් අතර ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව පියවර ගනිමින් සිටින බව, තවද, හිස් ඉඩම් විස්තර ඉඩම් බැංකුවට ඇතුළත් කර ඇති අතර, නව උපාය මාර්ගයක් ලෙස, කලාපීය ඉඩම් ප්‍රවර්ධනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය දැනට සිටින ආයෝජකයින් දැනුවත් කරන බව. | හිස් ඉඩම් ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ රු. 516,964,285 ක වියදමින් ඉදිකරන ලද කිලෝමීටර් 10.8 ක අභ්‍යන්තර මාර්ගයෙන් මීටර් 800 ක් පමණක් භාවිත කර තිබුණි. තවද, මාර්ගයේ පළල මීටර් 26.5 සිට මීටර් 33 දක්වා පරාසයක පවතින අතර එය ප්‍රමිතිගත පළල වූ මීටර් 7.4 ක කැරේජ් පළල සමග සමස්ත මීටර් 20 ක වෙන් කිරීමකට වඩා වැඩි තිබුණි. | මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ මාර්ග පද්ධතිය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ආරම්භ කර ඇති අතර ඉඩම ඔවුන් සතුව පවතින කාලයේ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) එය මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) පවරා දී ඇති බව, 2012 දී මාර්ග සංවර්ධන අධිකාරියට (RDA) විසින් සිදු කරන ලද ඉදිකිරීම් කටයුතු සමග ඉඩම ආයෝජන මණ්ඩලයට පවරා දෙන ලද බව. | කලාපවල අභ්‍යන්තර මාර්ග නිසි ලෙස සැලසුම් කර ඉදිකළ යුතුය. |
| (ඇ) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට (SLRCS) වෙන් කරන ලද කටුනායක අපනයන සැකසුම් කලාපය ආසන්නයේ අක්කර 5 රූඩ් 3 පර්චස් 30.1ක් සහිත ඉඩමක් 2022 ඔක්තෝබර් 12 දින වන විට ඌන උපයෝජනයට පත්ව තිබුණි. | ශ්‍රී ලංකා රතු කුරුස සමාජය (SLRCS) සහ ආයෝජන මණ්ඩලය යන දෙපාර්ශවයටම අන්‍යෝන්‍ය ප්‍රතිලාභ බෙදා ගැනීම සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනාගැනීමේ ක්‍රම සහ විධි ගවේෂණය කිරීමට දෙපාර්ශවයම එකඟ වූ බව. | පවතින ඉඩම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.3 ඡේදයට අනුව, ප්‍රසම්පාදන ආයතනය විසින් සියලු ආශ්‍රිත පිරිවැය ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කළ යුතු වීම සහ සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන කටයුතු සූදානම් කිරීමේ ක්‍රියාකාරකම්වල පිරිවැය සහ පසු පාලන ප්‍රදානය කිරීමේ ක්‍රියාකාරකම්වල පිරිවැය වෙන වෙනම හඳුනා ගත යුතු වීම සිදු කළ යුතු වුවද ඉහත අවශ්‍යතාවයන් සැපිරීමට අපොහොසත් වීම හේතුවෙන් මාණ්ඩලික සේවා බස්රථ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය තුළ එක් එක් ගමන් මාර්ග වල කිලෝමීටරයකට ගෙවන අනුපාතයන්හි වෙනස් වී තිබුණි. | මිල ඇස්තමේන්තුකරණ අදියරේදී එක් එක් ගමන් මාර්ගය සඳහා කලින් සඳහන් කළ මිල ගණන් අනුව ඇස්තමේන්තුව සකස් කර තිබුණු බව, කෙසේ වෙතත්, එක් එක් මාර්ගයේ මිල, සාධක අනුව වෙනස් වන බව, එබැවින් විද්‍යාත්මක ක්‍රමවේදයක් භාවිතා කර පිරිවැය ඇස්තමේන්තුව සැදිය නොහැකි බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |